(ට)

පානදුර අධිකරණ කලාපයේ මහාධිකරණය

මහාධිකරණයේ අපරාධ නඩු අංකය } 1966/2005

පළාත්බද මහාධිකරණය
17 JUN 2019
පානදුර


නීතිපතිගේ අංකය : ඩබ් 1/186/2004


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

විරුද්ධව

01. මැලව්වේ තන්තිරිගේ සමන් කුමාර

02. දිසානායක මුදියන්සේලාගේ හේමන්ත දිසානායක





**පානදුර මහාධිකරණ විනිසුරු සරෝජිනි කුසලා වීරවර්ධන මැතිතුමිය ඉදිරිපිටදී ය.**

වාර්තා කලේ : ල/ලේ/ වී.අයි. අසන්ති

නඩු අංකය: 1966/2005.

දිනය; 2013.10.30

පළාත්බද මහාධිකරණය
17 JUN 2019
පානදුර

**තීන්දුව හා හේතු.**

මෙම නඩුවේ චූදිත වන වැලැව්වේ තන්තිරිගේ සමන් පත්ම කුමාර සහ දිසානායක මුදියන්සේලාගේ හේමන්ත දිසානයක යන අයවලුන්ට එරෙහිව නගා ඇති චෝදනාව වන්නේ, වර්ෂ 2002 ක් වූ ජුනි මස 26 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ බලසීමාව තුල පිහිටි අඟුරුවාතොට පොලිස් ස්ථානයේදී චූදිතයින් මහජනතාවට අප්‍රසන්නතාවයක් ඇති වන පරිදි බීමත්ව කරන ක්‍රියාවක් සම්බන්ධයෙන් සැකපිට අත් අඩංගුවට ගන්නා ලද ගිනිමැලගේ දයාරත්න යන අය විසින් කරන ලදැයි සැක කරන ක්‍රියාව සම්බන්ධයෙන් දඬුවම් දීම සඳහා වධ දුන් බැවින් 1994අංක 22 දරන වධ දීමට හා අනෙකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහිව වූ සම්මුතිය පනතෙහි 2 (4) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කල බවය.

චූදිතට එරෙහිව නගා ඇති චෝදනාවට චූදතයින් වැරදිකරුවන් කිරීම සඳහා ගිනිමැල්ලගේ දයාරත්න නැමැත්තාව බීමත්ව කරන ක්‍රියාවක්

සම්බන්ධයෙන් සැක පිට අත්අඩංගුවට ගෙන දඩුවම් දීම සඳහා වධ දුන් බවටසාධාරණසැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතුව ඇත.

මෙම නඩුව විභාගයට ගත් අවස්ථාවේදී පැ.සා. 1 මිය ගොස් සිටී හෙයින් ඔහුගේ සාක්ෂිය මෙහෙ වීමට පැමිණිල්ලට හැකියාවක් ලැබී නැති මුත් පැමිණිල්ලේ සාක්ෂි ලැයිස්තුවේ නම් කරන ලද සාක්ෂිකරුවන් දස දෙනා අතරින් පැ.සා. 7 හැරෙන්නට අනිත් සියළුම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවා පැ.සා. 1 නමින් නිකුත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තා 3 ක් පැ. 1 පැ. 2 සහ පැ .4 වශයෙන් ද පැ.සා. 1 ගේ මරණ සහතිකය පැ. 3 වශයෙන් ද සලකුණු කර ඉදිරිපත් කර ඇත. පැ.සා. 1 ව පරීක්ෂා කර ඇති වෛද්‍යවරයෙකු වූ පැ.සා.7 ව පැමිණිල්ල විසින් සාක්ෂියට කැඳවීම සිදු නොකලද එකී වෛද්‍ය වාර්තාවෙහි අඩංගු කරුණු එනයින්ම පවතින බවට විත්තිය විසින් පිලිගෙන ඇති හෙයින් එකී කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වන වගන්තිය යටතේ පිලිගැනීමක් ලෙසට ලකුණු කර ඇත.

පැමිණිල්ලේ නඩුව අවසන් කල අවස්ථාවේදී විත්තිය නොකැඳවාම චූදිතයින් නිදහස් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 200 (1) උප වගන්තිය යටතේ විත්තිය ඉල්ලීමක් කර 2 ඇති හෙයින් පැමිණිල්ලේ සාක්ෂි මගින් චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාව ඔප්පු කර ඇත්දැයි විමසාබලමි.

මෙම නඩුවෙහි අපරාධ වින්දිත ගිනිමැල්ලගේ දයාරත්න වන පැ.සා. 1 සා ක්ෂි ලබා දීමට පෙර මිය ගොස් සිටි හෙයින් මෙම නඩුවට අදාළ සිද්ධියේදී ඇත්ත වශයෙන්ම කුමක් සිදු වුයේද යන්න අනාවරණය කර ගැනීමට හැකියාවක් ලැබී නැත.

මහාධිකරණය
17 JUN 2019

කෙසේ වුවද පැමිණිල්ල විසින් පැ.සා. 3 වශයෙන් සාක්ෂියට කැඳවූ ජනකනාත් කිතුල්ගොඩ නැමැත්තා පැ.සා. 1 ගේ නංගිගේ පුතාය. ඔහු විසින් පැ.සා. 1 ට සිදු වූ සිද්ධිය ඇසින් දුටු බවට මෙම නඩුවට අදාල සිද්ධිය සිදු වූ අවස්ථාවේදි ඔහු හැරෙන්නට දහ පහලොස් දෙනෙක් බලාගෙන සිටි බවටද සාක්ෂියක් ලබා දී ඇති මුත්, ( 2012.11.19 දින සාක්ෂි. පෙ.ව. 10.55 ට. 6 පිටුව.) පැමිණිල්ල විසින් කැඳවන ලද කිසිදු සාක්ෂිකරුවකු විසින් පැ.සා. 1 ට කිසියම් තැනැත්තෙකු පහර දෙනු දුටු බවට සාක්ෂියක් ලබා දී නැත.මේ හැරෙන්නට මෙම සිද්ධිය සම්බන්ධව ඔහු පොලිසියට කටඋත්තර 2 ක් ලබා දී තිබු බවටද සාක්ෂියක් ලබා දුන්නද, පලමු කටඋත්තරය ලබා දුන්නේ සිද්ධිය සිදු වි මාස 3 කට පසුව බවටත්, 2 වන කටඋත්තරය ලබා දුන්නේ 2004 දී බවටත් පිලිගෙන ඇත. ( 2012.11.19 දින සාක්ෂි. 2 පිටුව) එසේ වුවද එතරම් පමා වී ප්‍රකාශයක් ලබා දීමට හේතු වූ කිසිදු සාධාරණ හේතුවක් ඉදිරිපත් කර නැත. එහෙයින් මෙම සාක්ෂිකරුට මෙම නඩුවට අදාල සිද්ධිය සම්බන්ධයෙන් හොඳින් සිතා බලා සැලසුම් කර ප්‍රකාශයක් ලබා දීමට අවස්ථවක් තිබී ඇති බවට පෙනීයන හෙයින් එකී සාක්ෂිය අප්‍රමාදී භාවයෙහි පරීක්ෂණයට ලක් කල විටදී ( Test of promptness ) අසමත් වන විශ්වසනීයත්වයෙන් හීන සාක්ෂියකි.

එහෙයින් ඔහු සත්‍යයක් පවසන්නේද යන්න විමසා බැලිය යුතුව ඇත්තේ ඉතා ප්‍රවේශමෙනි.

පැ.සා.3 විසින් මූලික සාක්ෂි දුන් අවස්ථාවේදී මෙම නඩුවට අදාළ සිද්ධිය සිදු වූ පසු "කුමාර " යනුවෙන් හඳුන්වනු ලබන ජගත් කුමාර අපරාධ ස්ථානයට පැමිණි බවට, නිවසේ සිටියදී දුටුව බවට සාක්ෂියක් ලබාදී තිබුනද ( 2012.09.05 දින සාක්ෂි. පෙ.ව.11.35 ට. 5 සහ 6 පිටු ) හරස් ප්‍රශ්න ඇසූ අවස්ථවේදී ජගත් කුමාර ගැන මතකයක් නොමැති බවට පවසා ඇත. (2012.09.05 දින සාක්ෂි. පෙ.ව.11.55ට. 4 පිටුව) එනමුදු පැ.සා. 3 විසින් විශේෂ විමර්ශන ඒකකයට ලබා දුන් කටඋත්තරයෙහි " කුමාර " යන අය ඇතුළුව තවත් කිහිප දෙනෙක් සිටි බවට සඳහන් කර ඇති බවට පෙන්වා දෙමින් එකී පරස්පර විරෝධතාවය වි.1 ලෙසට ලකුණු කර ඉදිරිපත් කර ඇත. ( 2012.09.05 දින සාක්ෂි පෙ.ව. 11.55 ට. 6 පිටුව සහ2012.11.19 දින සාක්ෂි 2,3 සහ 4 පිටු) මේ අනුව ජගත් කුමාර නැමැත්තාව සිද්ධිය සිදු වූ පසුව අපරාධ ස්ථානයට පැමිණි කරුණ සම්බන්ධයෙන් නිවැරදි සාක්ෂියක් ලබා දීමට අපොහොසත් වී ඇති බවට පැහැදිලි වෙයි. මේ හැරෙන්නට පැමිණිල්ල විසින් පැ.සා.2 ලෙසට කැඳවා ඇති ජගත් කුමාර නැමැත්තාගෙන් "මොනවා හෝ සිද්ධියක් වුනා කියලා දැනගන්න ලැබුනාද" යනුවෙන් විමසූ විටදී පවසා ඇතිතේ " පසුවදා උදේ දැන ගත්තේ " වශයෙනි.

( 2012.12.13 දින සාක්ෂි. පෙ.ව. 11.30 ට. 3 පිටුව)

පැ.සා.3 ජගත් කුමාර ද අපරාධ ස්ථානයෙහි සිටි බවට අපරාධ විමර්ශන අංශයට ප්‍රකාශයක් ලබා දෙද්දී සිද්ධිය වූ අවස්ථාවෙහි හොඳින් සිතා බලා සිදු කර ඇති ප්‍රකාශයක් වන හෙයින් අමතක වීමකින් එකී කරුණ සඳහන් කල බවට නිගමනය කල නොහැක. එසේම පැ.සැ.2 ද සිද්ධිය වූ දින අපරාධ ස්ථානයට ගියා නම් එය ඔහුට විශේෂ සිද්ධියක් වන හෙයින් කාලයත් සමඟ අමතක වූවායැයි සිතිය නොහැක. මේ අනුව අපරාධ ස්ථානයට නොපැමිණි අයවළුන්ද පැමිණි බවට හඟවමින් පැ.සා.3 ලබා දී ඇති සාක්ෂියද සම්පූර්ණයෙන්ම ඒකාකාරී බවින් තොරවූ එකී පරීක්ෂණයෙන්ද අසමත් වන ( Test of consistency) අසත්‍ය සාක්ෂියක් බවට පැහැදිලි වෙයි. එමෙන්ම මෙබඳු අන්දමට අසත්‍ය සාක්ෂියක් දෙනු ලබන්නේ අධිකරණය නොමඟ යැවීම සඳහාද යන සාධාරණ සැකය හට ගනී.

පළාත්බද මහාධිකරණය
17 JUN 2019

මේ අනුව පැ.සා. 3 ලබා දී ඇති සාක්ෂියෙහි විශ්වසනීයත්වය තවදුරටත් හීන වෙයි.

පැ.සා.3 විසින් ඔහුට සහ අපරාධ වින්දිත දයාරත්නට පහර දීම සිදුකල අන්දම සම්බන්ධයෙන් විස්තර කරමින් මූලික සාක්ෂි ලබා දුන් අවස්ථාවේදී පවසා ඇත්තේ රාත්‍රී 10 ටත් , 10.30 ට පමණ වූ වේලාවේදී නිදා ගැනීමට ගිය අවස්ථාවේදී පාර දෙසින් කෝලහලයක ශබ්දයක් ඇසී එය කුමක්දැයි බැලීමට ගිය විටදී ඔටෝ ජියර් මෝටර් රථයකින් සහ ලොරි රථයකින් පැමිණි පුද්ගලයින් දෙපිරිසක් අතර බහින් බස්වීමක් තිබූ බවටත්, එකී මෝටර් රථය පාරෙන් ඉවත්

කිරිමට දයාරත්න නැමැත්තා තැත් දැරුවද මොටර් රථයේ අය ඊට ඉඩ නොදුන් හෙයින් වාහන පේලියක් පාරේ නවතා තිබු බවටත්, විනාඩි 45 ක්, පැයකට පමණ පසුව මීටර් 100 ක් පමණ එහායින් නවතා තිබු පොලිස් ජීප් රථයක සිටි සිවිල් ඇඳුමින් පැමිණි මෙම නඩුවෙහි චූදිතයින් දෙනාගෙන් 1 වන චූදිත විසින් දයාරත්නගේ කම්මුලට අතින් එක් පහරක්ද, වයර් එකකින් පිටට තවත් පහරක්ද ලබා දී ජීප් රථයට දමා අරන් ගිය බවටත් ය. ( 2012.09.05 දින සාක්ෂි. පෙ.ව.11.20ට. 3 සිට 14 දක්වා පිටු සහ එදිනම පෙ.ව.11.35 ට. 1 සහ 2 පිටුව) එමෙන්ම ඉහතකී අන්දමට දයාරත්නට පහර දීමෙන් පසුව ඔහු ලඟට පැමිනි 2 වන චූදිත විසින් ඔහුව 1 වන චූදිත ලඟට ගෙන ගිය බවටත්, එම අවස්ථාවේදී 1 වන චූදිත විසින් ඔහුට ද පහර දීමක් සිදු කල බවටත් සාක්ෂියක් ලබා දී ඇත. එසේම ඉහත කී දයාරත්න ද ජීප් රථය තුල සිටිනු දුටු බවට පවසා ඇත. ( 2012 . 09. 05 දින සාක්ෂි. පෙ.ව.11.30 ට. 3 සහ 4 පිටු ) මේ අනුව මෙම නඩුවට අදාළ සිද්ධිය වූ අවස්ථාවේදී අපරාධ වින්දිත දයාරත්න පමණක් නොව ඔහුටද පහර දීමක් සිදු වු බවට පැ.සා. 3 විසින් සාක්ෂියක් ලබා දෙමින් ඔහු අපරාධ ස්ථානයෙහි සිටි බවට පෙන්වා දීමක් සිදු කර ඇති බවට පෙනී යන හෙයින් එකී සාක්ෂිය පිලිගත හැකිදැයි විමසා බලමි.

ඉහත කී සිද්ධිය සිදුවූ අවස්ථාවේදී ඉහත කී දයාරත්න හැසිරුනු අන්දම සම්බන්ධයෙන් පැ.සා.3 ගෙන් හරස් ප්‍රශ්න ඇසූ අවස්ථාවේදී ලබා දී ඇත. පිලිතුරු පහත වෙයි.

ප්‍ර. මොකක්ද ඇහුවේ තමන් ගිහිල්ලා ?

උ. පාර හරහා තිබුණු වාහනය අයින් කරන්න උදවුකරන්න කතා කලා.

ප්‍ර. ඔය වචනයෙන්ද ඒ වෙලාවෙ කිව්වේ ?

උ. උදවු කරන්න කතා කලේ. කාර් එකේ බැට්ට්‍රියක් ගෙනැල්ලා මාරු කරලා කාර් එක එතනින් ඉවත් කරන්න කථා කලේ.

17 JUN 2019
18
පානදුර

ප්‍ර. කවුද කිව්වේ බැට්ට්‍රියක් ගේන්න කියලා ?

උ. පාරෙ මැද හිටිය වාහනයේ රියදුරු

ප්‍ර. කාර් එක උස්සලා පැත්තකින් තියලා උදවු කරන්න හැදුවේ නැද්ද?

උ. එහෙම කිව්වේ පාරේ වාහනවල ආපු අය කතා කලා.

ප්‍ර. පාරේ හිටිය අනිත් අය මොකක්ද කිව්වේ?

උ. වාහනය උස්සලා ඉවත් කරන්න හැදුවේ.

ප්‍ර. බැලුවාද එහෙම කරන්න ?

උ. බැලුවා.

ප්‍ර. ඒ අතරතුර බහින් බස් වීමක් ඇති වුණේ කවුරු අතරද ?

උ. පාර හරස් වෙලා තිබ්බ වාහනේ අයයි අනිත් පාරේ හිටිය අයයි එක්ක.

ප්‍ර. ඒගොල්ලෝ අතර බහින් බස් වීම වෙනකොට දයාරත්න හිටියේ කොහේද ?

උ. පාරේ හිටියේ.

ප්‍ර. දයාරත්න බහින් බස් වීමට සම්බන්ධ වුනේ නැහැ?

උ. නැහැ.

ප්‍ර. එතකොට දයාරත්න කාත් රක්වත් රණ්ඩු වුනේ නැත්ද ?

උ. ඒ වෙලාවේ රණ්ඩුවක් වුණේ නැහැ.

ප්‍ර. එතකොට ඔය දයාරත්න බහින් බස් වීමට ගියෙත් නැහැ ?

උ. නැහැ.

ප්‍ර. කිසිදු රණ්ඩුවකට ගියෙත් නැහැ ?

උ. නැහැ.

ප්‍ර. දයාරත්න පැත්තට වෙලා හිටියා ?

උ. ඔව්.

ප්‍ර. තමනුත් පැත්තකට වෙලා හිටියා ?

උ. ඔව්.

ප්‍ර. තමන්ට ඔය සිද්ධියේදී කවුරු හරි ගැහුවාද ?

උ. ඔව්.

ප්‍ර. කවුද ගැහුවේ ?

උ. පොලිසියෙන් ආපු මහත්තයෙක් පාරක් ගැහුවා.

ප්‍ර. තමන් පැත්තක වෙලා බලාගෙන ඉන්දෙද්දි ගැහුවාද ?

උ. ඔව්.

ලොත්බද මහේස්ත්‍රාත්
17 JUN 2019
පානදුර

ප්‍ර. දයාරත්නටත් ගැහුවාද ?

උ. ඔව්.

(2012.11.19 දින සාක්ෂි. පෙ.ව.10.55 ට. 4 සහ 5 පිටු.

ඉහත කී සාක්ෂි අනුව පෙනී යන්නේ වාහන දෙකක් හරස් වීම නිසා පාරේ සිදු වූ සිද්ධියට පැ.සා.3 හෝ දයාරත්න නැමැත්තා කිසිදු අයුරකින් සම්බන්ධ වී නොමැති බවටත්, ඔවුන් දෙදෙනා පාඩුවේ පැත්තකට වී බලා ගෙන සිට ඇති බවටත්ය. එසේ වුවද දයාරත්න සිද්ධියට සම්බන්ධ වී සිටි අන්දම මුලික සාක්ෂි විමසු අවස්ථාවේදී ලබාදී ඇති පිලිතුරු පහත වෙයි.

ප්‍ර. දැන් ඔය ගිනිමැලගේ දයාරත්න යන අය ඔය සිද්ධියට කොහෙමද සම්බන්ධ වුනේ ?

උ. කාර් රථයට උදවු කරන්න ආවේ. කාර් රථය පාරෙන් ඉවත් කරන්න ආවේ.

ප්‍ර. කාර් රථය කොහොමද ඉවත් කලේ ?

උ. කාර් එකේ ආපු අය කිව්වේ අයින් කරන් බැහැ කියලා .

ප්‍ර. කවුද බැහැ කිව්වේ ?

උ. කාර් එකේ ආපු අය.

ප්‍ර. එතන ගිනිමැලගේ දයාරත්නත් හිටියාද ?

උ. ඔව්.

ප්‍ර. ඔහු මොන ආකාරයෙන්ද ඒ අවස්ථාවේ හිටියේ ?

උ. කාර් එකට උදවු කර කර හිටියේ.

ප්‍ර. මොන කාරයටද උදවු කලේ ?

උ. කාර් රථයේ අය කිව්වා ලොරි රථයේ ලයිට් ඩිම් කලේ නැති නිසා කාර් එක පාර පේන්නේ නැතිව නතර වුණා. කාර් එක ඔටෝ ගියර් කාර් එකක් නිසා තල්ලු කරලා අයින් කරන්න බැහැ කියලා.

ප්‍ර. කවුද එහෙම කිව්වේ ?

උ. කාර් එකේ අයිතිකරු.

ප්‍ර. ගිනිමැලගේ දයාරත්න කියන අය කොහොමද ඒ අවස්ථාවේ හිටියේ. මොනවත් කලාද?

උ. එයාත් කාර් රථය අයින් කරන්න උදවු කරන්න හැදුවේ.

ප්‍ර. කොහොමද උදවු කරන්න හැදුවේ ?

උ.  බැට්‍රියක් ගෙනැල්ල කාර් රථය ස්ටාට් කරලා පාරෙන් ඉවත්

කරන්න හැදුවේ .

නමුත් ඊට ඉඩ දුන්නේ නැහැ.

පළාත්බද මහාධිකරණය
17 JUN 2019
10
පානදුර

ප්‍ර.  කවුද ඉඩ දුන්නේ නැත්තේ ?

උ.  කාර් රථයේ ආපු අය.

( 2012.09.05 දින සාක්ෂි.  පෙ.ව.11.20 ට.  6 සහ 7 පිටු)

ප්‍ර.  දැන් තමන් කිව්වා මේ කාර් රථයේ ඉන්න අය පහර දුන්නා කියලා

උ.  ඔව්.

ප්‍ර.  කාටද පහර දුන්නේ ?

උ.  ගිනිමැලගේ දයාරත්නට පහර දෙමින් හිටියේ.

ප්‍ර.  තමන් කිව්වෙ ගිනිමැලගේ දයාරත්න ගියේ උදවු කරන්න කියලා?

උ.  ඔව්.

ප්‍ර.  එතකොට පහර දුන්නේ කොහොමද?

උ.  ඒ අය කිව්වා කාර් රථය ඉවත් කරන්න එපා කියලා.  කාර් රථයේ

ආපු අය කිව්වේ.

(2012.09.05 දින සාක්ෂි .  පෙ.ව. 11.20 ට.  12  පිටුව)

ඉහත කී සාක්ෂි සලකා බැලීමේදී පෙනී යන්නේ පාරේ හරස් ව තිබූ මෝටර් රථය පාරෙන් ඉවත් කිරීම සඳහා මෝටර් රථයේ අයිතිකරුගේ කැමැත්ත රහිතව

ඉහත කී දයාරත්න නැමැත්තා සක්‍රියව ක්‍රියා කරමින් බැටරියක් පවා ගෙන් වීමට උත්සාහ දරා ඇති බවත්, ඊට උරන වූ මෝටර් රථයෙහි අයිතිකරු දයාරත්න නැමැත්තාට පහර දීමක් පවා සිදු කර ඇති බවටත්ය. මේ අනුව අපරාධ වින්දිත දයාරත්නගේ හැසිරීම සම්බන්ධයෙන් පැ.සා.3 මුලික සාක්ෂි ලබා දුන් අවස්ථාවේදී එකී දයාරත්න කලහකාරී ලෙසට හැසිරුනු බවට පවසා සිටියත් අනතුරුව හරස් ප්‍රශ්න ඇසූ අවස්ථාවේදී එකී දයාරත්න නැමැත්තා අහිංසකව පැත්තකට වී සිටි පුද්ගලයෙකු බවට පෙන්වා දීමට උත්සාහ දරා ඇති බවටත් පැහැදිලි වන හෙයින් එකී සාක්ෂි ඒකාකාරී භාවයෙහි පරීක්ෂණයට ලක් කිරීමේදී ( Test of consistency) අසමත් වෙයි.

පැ.සා.3 හැරෙන්නට පැමිණිල්ල විසින් කැඳවූ කිසිදු සාක්ෂිකරුවෙකු විසින් මෙම සිද්ධිය දැක නොමැත. ඒ අනුව පැ.සා.3 විසින් පවසාසිටින කරුණු සත්‍ය දැයි විමසා බැලීමට හැකියාවක් නැත. එසේම පැ.සා. 3 ඉහත කී දයාරත්නගේ කිට්ටුම ඥාතියෙකු වන හෙයින් ස්වාධින සාක්ෂිකරුවෙකු ලෙසටද සලකා බැලිය නොහැක. මෙම කරුණු අනුව ඉහත කී අන්දමට පරස්පර විරෝධි අන්දමට පැ.සා.3 විසින් සාක්ෂි දෙනු ලබන්නේ ඇත්ත වශයෙන්ම ඔහු විසින් සැබවින්ම නුදුටුව දෙයක් පසුව දයාරත්නත් සමඟ එකතු වී ගොතා පැවසීම නිසා ඔහුට පෙර කී කරුණු කුමක්දැයි යන්න පසුව අවස්ථාවකදී අමතක වී තිබීම නිසාද යන

සාධාරණ සැකය හට ගනී. එසේම ඉහත කී දයාරත්න නැමැත්තැට මෙම සිද්ධියේදී මොටර් රථයෙන් පැමිණි අයද පහර දීමක් සිදු කර ඇති බවටද පෙනී යන හෙයින් ඔහුට යම් තුවාලයක් ඇති වූයේ නම් ඒ ඇති වූයේ කා නිසා දැයි යනුවෙන්ද බරපතල ගැටළුවක් පැන නගී.

පළාත්බද මහාධිකරණය
17 JUN 2019

මේ හැරෙන්නට පැ.සා.3 විසින් පාරෙහිදි සිදු වූ සිද්ධිය වූ අවස්ථාවේදී දයාරත්න නමැත්තාගේ සිරුරෙහි තුවාල නුදුටුව බවටපවසා සිටියද ඔහුව පොලිසියට රැගෙන ගොස් පසු දින හමු වූ අවස්ථාවේදී පිටේ ලේ ආපු අඟල් 5,6 ක ප්‍රමාණයේ තුවාල දුටුව බවටත්, එකී තුවාලවලට බෙහෙත් දමා තිබුනද, ප්ලාස්ටර් දමා නොතිබූ බවටත් පැහැදිලි සාක්ෂියක් ලබා දී ඇත. ( 2012.09. 05 දින සාක්ෂි. පෙ.ව. 11.35. 8 පිටුව.)

එසේ වුවද පැමිණිල්ල විසින් පැ.සා.5 වශයෙන් සාක්ෂියට කැඳවනු ලැබූ අධිකරණ වෛද්‍ය කුමුදු කුමාරි ජුසර් විසින් ඉහත කී දයාරත්න නැමැත්තාව 2002.07.02 වැනි දින වෛද්‍ය පරීක්ෂාවට ලක් කල බවටත්, එකී දයාරත්න නමින් නිකුත් කල අධිකරණ වෛද්‍ය වාර්තාව පැ. 2 ලෙසට සලකුණු කර ඉදිරිපත් කරමින් රෝගියා විසින් 2002.06.26 වැනි දින පැය 9.30ට පහර දීමකින් වම් ඇසේ පෙනීම අඩු වී වම් කනේද ඇසීම අඩු වූ බවටත් ඇයට පවසා සිටි බවට සඳහන් කර ( 2013.06.19 දින සාක්ෂි. 4 පිටුව. ) බාහිර තුවාල 3 ක් නිරීක්ෂණය කරනු ලැබුවද එකී තුවාල නිරීක්ෂණය කරනු ලැබුවේ වම්පස ඇසට සහ කනට ඉහලින්ද, දකුණු පස ඇසට පහලින්ද වන බවට සාක්ෂයක් ලබා දී ඇති

අතර වයර් එකක් වැනි දෙයකින් සිදු කල පහරදීමකින් වූ තුවාලයක් නුදුටුව බවටද පවසා ඇත. ( 2013.06.19 දින සාක්ෂි. 7 සහ 8 පිටු.) එසේම ශරීරයේ " පිටුපස තුවාල තිබුනාදැයි විමසීමක් ද සිදු කර ඇති අතර ඊට පිටුපස පහරදීමේ තුවාල තිබුනේ නැහැ " යනුවෙන් පිලිතුරු දී ඇත. ( 2013.06.19 දින සාක්ෂි 12 පිටුව. )

මේ අනුව පැ.සා. 3 පවසා සිටින අන්දමට දයාරත්න නැමැත්තාගේ පිටේ ලේ ගලන තුවාල ඇත්ත වශයෙන්ම තිබුනේ නම් දයාරත්න නැමැත්තාව වෛද්‍ය පරීක්ෂණයට ලක් කල පැ.සා. 5 ට එය නිරික්ෂණය කිරීමට හැකියාවක් නොලැබුනා යැයි කෙසේවත් සිතිය නොහැක. තවද එකී දයාරත්න විසින් පැ.සා. 5 ට ලබා දී ඇති කෙටි රෝග ඉතිහාසයෙහි හෝ පිටේ සිදු වූ තුවාලයක් ගැන කිසිවක් පවසා නැති බවට පැහැදිලි වෙයි. පැ.සා. 5 ස්වාධීන සාක්ෂිකරුවෙකු වන හෙයින් අසත්‍ය සාක්ෂියක් දෙනු ලබතැයි ද නිගමනයකට පැමිණිය නොහැක. ඉහත කරුණු සලකා බැලීමේදී ඉහත කී දයාරත්න නැමැත්තාට පහර දීමකින් පිටෙහි කිසි තුවාලයක් හට ගෙන නොමැති බවට අනාවරණය වන හෙයින් දයාරත්න නැමැත්තාගේ පිටේ තුවාල දුටු බවට පැ.සා.3 ලබා දී ඇති සාක්ෂියද සම්පූර්ණයෙන් අසත්‍යයක් බවට පෙනී යයි. මේ අනුව මෙම නඩුවෙහි කිසිදු චූදිතයෙකු විසින් දයාරත්න නැමැත්තාට පිටට වයරයකින් පහර දී තුවාල කර ඇති බවට නිගමනය කල නොහැකි බැවින් ඔවුන් විසින් අපරාධ විධිතට වධ හිංසා පමුණුවා ඇතැයිද නිගමනය කල නොහැකි බවට නිගමනය කරමි.

මේ හැරෙන්නට දයාරත්න නැමැත්තා විසින් පහර දීමක් ගැන සඳහන් කර සිටියේ 9.30 ට පමණ බවට පැ.සා. 5ර විසින් සාක්ෂියක් ලබා දී ඇති අතර, පැ.2

දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව එම වේලාව රාත්‍රී 9.30 ට බවට සටහන්ව ඇත. කෙසේ වුවද මෙකී පහර දීම සිදු කලේ කවුදැයි යන්න සඳහන් කල බවට පැ.සා.5 සාක්ෂියක් ලබා දී නැති අතර පැ.2 හි හෝ එය සඳහන් කර නැත. (පැ.2 හි 1පිටුව)

17 JUN 2019

පැ.සා.3 ට අනුව මෙම සිද්ධිය ආරම්භ වී ඇත්තේ රාත්‍රී 10 ත්, 10.30 ටත් පමණ පසුවය. පොලිස් ජීප් රථය පැමිණ ඇත්තේ ඊට පැයකට පසුවය. මේ අනුව පහර දීම චූදිතයින් විසින් සිදු කලා නම් සිදුකල යුතුව ඇත්තේ අවම වශයෙන් රාත්‍රී 11 ට පමණය. මේ අනුව ඉහත කී දයාරත්න නැමැත්තාගේ ඇසේ සහ කනේ ආබාධයක් සිදු වුවා නම් එය සිදුවී ඇතතේ රාත්‍රී 9.30 ට පමන බවට දයාරත්න නැමැත්තා විසින් පැ.සා.5 ට කර ඇති ප්‍රකාශයත් චූදිතයින් අපරාධ ස්ථානයට පැමිණ ඇති වේලාවත්, මෝටර් රථයෙන් පැමිණි අයද දයාරත්නට පහර දීමක් සිදු කර ඇති බවට අනාවරණය වී ඇති කාරණයත් යන සියල්ලම එකිනෙකට ගෙන සලකා බැලීමේදී යම් පහර දීමක් නිසා අපරාධ වින්දිතට තුවාල වීමක් සිදු වුවා නම් එසේ සිදු වී ඇත්තේ මෝටර් රථයෙහි පැමිණි අය පහර දුන් නිසාද යන සාධාරණ සැකයද හට ගනී. තවද පැ.සා. 5 ට අනුව දයාරත්න නැමැත්තාගේ මුහුණෙහි දකුණු පස මෙන්ම වම් පසෙහිද තුවාල තිබී ඇත. ඒ අනුව එකී දයාරත්නගේ මුහුණෙහි දෙපැත්තටම පහර දී ඇති බවට පෙනී යන හෙයින් එක් පහර දීමකට වඩා පහරදීමක් සිදු කර ඇති බවට පෙනී යයි. එනමුදු පැ.සා. 3 ට අනුව දයාරත්න නැමැත්තාගේ මුහුණට මෙම නඩුවෙහි 1 වන චූදිත පහර දී ඇත්තේ එක් පහරක් පමණි. (2012.09.05 දින සාක්ෂි, පෙ.ව.11.35 ට. 2 පිටුව සහ 2012. 11 .19 දින සාක්ෂි. පෙ.ව.10.55 ට. 7 පිටුව.) පොලිසියට ගෙන

ගොස් පහර දීමක් සිදු කර ඇති බවට මෙම සාක්ෂිකරු පවසා සිටියත් පැ.සා.5 වූ අධිකරණ වෛද්‍යවරයා දයාරත්න නැමැත්තා විසින් පොලිසියේදී සිදු කල පහර දීමක් ගැන පවසා නැති බවට පැහැදිලි වෙයි. ඉහත සියළු කරුණු සලකා බැලීමේදී දයාරත්න නැමැත්තාට රාත්‍රි 9.30 ට පමණ සිදු කල පහර දීමකින් ඔහුගේ ඇසේ සහ කනේ ආබාධයක් මට ගෙන ඇති බවට පැ.සා. 5 ලබා දී ඇති සාක්ෂි මගින් අනාවරණය වී තිබුනද එකී තුවාල මෙම චූදිතයින් විසින් සිදු කල පහර දීමක් මත හට ගෙන තිබූ තුවාල යැයි ස්ථිරවම නිගමනය කල නොහැකි බවට තීරණය කරමි.

මේ හැරෙන්නට මෙම නඩුවට අදාල සිද්ධිය වූ අවස්ථාවේදී පැ.සා.3 ව ජීප් රථය අසලට ගෙන ගොස් ඔහුගේ පිටටද වයර් එකකින් පහර දුන් පසුව ඔහු ගෙදර දුව ගිය බවට සාක්ෂියක් ලබා දුන්නද, (2012.11.19 දින සාක්ෂි.පෙ.ව. 10.55 ට. 11 සහ 12 පිටු.) පොලිසියට ලබා දී ඇති ප්‍රකාශයෙහි පහර දුන් ආකාරය විස්තර කිරීමේදී එවිට එස්.අයි.පත්ම කුමාර මහත්තයා මට එක පාරටම පයින් පාරක් ගැහුවා. එම පාර මගේ වම් අතට වැදුනා. පසුව වටේ සිටි කට්ටිය කිව්වා මට දුවන්න කියලා. ඒ අනුව මම දුවන්න හදන කොට වයර් එකක් වගේ එකකින් පිටට වැදුනා. " යනුවෙන් ප්‍රකාශයක් කර ඇති බවට පෙන්වා දෙමින් වයර් එකකින් පහර දුන් ආකාරය සහ පහර දුන් අවස්ථාව සම්බන්ධව පවතින පරස්පර විරෝධතා වි.3 සහ වි.4 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. ( 2012.11.19 දින සාක්ෂි. පෙ.ව. 11.10 ට. 1,5 සහ7 පිටු.) ඉහත කී පරස්පර විරෝධතාවයක් පැ.සා. 3 විසින් මුහුණ දුන් සිද්ධියට අදාළ කරුණක් වන හෙයින් ඔහු පවසන

අන්දමට ඇත්ත වශයෙන්ම මෙම නඩුවෙහි 1 වන චූදිත විසින් ඔහුට පහර දුන්නේද යන්න සලකා බැලීම සඳහා වැදගත් වෙයි. පැ.සැ.3 ජීප් රථයට ගිය අවස්ථාවේදී 1 වන චූදිත වයරයකින් පහර දුන් හෙයින් ඔහුට එකී ස්ථානයෙන් පිටත් වීමට සිදු වුවා නම් එය සාමාන්‍ය අවස්ථාවකදී සිදු වූ විශේෂ සිදුවීමක් වන බැවින් ඔහුගේ මතකයෙන් පහසුවෙන් මැකීයයි යැයි සාධාරණව නිගමනය කල නොහැක. එනමුදු ඒ සම්බන්ධව පැ.සා.3 විසින්ම නිවැරදි සාක්ෂියක් ලබා දීමට අපොහොසත් වී ඇත්තේ ඇත්ත වශයෙන්ම ඔහු පවසන අන්දමේ සිදුවීමක් සිදු නොවූ නිසා යන සාධාරණ සැකයද වර්ධනය වෙයි.

පළාත්බද මහාධිකරණය
17 JUN 2019

ඉහත සියළු කරුණු සලකා බලන විටදී පැ.සැ. 3 විසින් දුටුවා යැයි සඳහන් කරනු ලබන මෙම නඩුවට අදාල සිද්ධිය ඇත්ත වශයෙන්ම ඔහුගේ ඥාති දයාරත්නගේ හෝ වෙනත් අයෙකුගේ අවශ්‍යතයක් මත පසුව ගොතන ලද අසත්‍යය කථාවක් ද යන සාධාරණ සැකයද හට ගන්නා බැවින් චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කර ඇති බවට පැ.සා. 3 ලබා දී ඇති සාක්ෂි මත නිගමනය කල නොහැකි බවට තීරණය කරමි.

අනතුරුව පැමිණිල්ල විසින් පැ.සා. 2 වශයෙන් සාක්ෂියට කැඳවූ විතානගේ ජගත් කුමාර ඉහත කී දයාරත්නට කිසිවකු විසින් පහර දෙනු දුටු තැනැත්තෙකු නොවන අතර ඔහු එකී දයාරත්න දුටුව බවට පවසා ඇත්තේ පොලිස් කුඩුවේදි ය. මෙම අවස්ථාවේදී දයාරත්න ඔහුට යමක් විශේෂයෙන් පැවසුවාදැයි විමසූ විටදී පවසා ඇත්තේ " නැහැ" යනුවෙනි. ( 2012.12.13 දින සාක්ෂි. පෙ.ව.11.45 ට. 2 පිටුව .) මේ අනුව මෙකී සාක්ෂියද චූදිතයින්ට එරෙහිව නගා ඇති

චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කල බවට නිගමනය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් නොවේ.

පැමිණිල්ල විසින් පැ.සා.4 වශයෙක් සාක්ෂියට කැඳවූ ගිනිමැල්ලගේ දීපාල් දයානන්ද නැමැත්තාද මෙම නඩුවට අදාලව සිදු වූ කිසිදු සිදුවීමක් දැක නැති අතර ඔහු පවසා ඇත්තේ දයාරත්න නැමැත්තා පොලිස් කූඩුවේ සිටියදී පොලිසියට ගොස් ඇප ලබා දුන් බව පමණි. ඔහුගෙන්ද දයාරත්න යමක් කී බවට මතකද යනුවෙන් ප්‍රශ්න කිරීමේදී ලබා දී ඇති පිළිතුරු වී ඇත්තේ " වෙන සිද්ධියක් මත නැහැ යනුවෙනි. (2012.12.13 දින සාක්ෂි. 4 පිටුව.) මේ අනුව මෙම සාක්ෂිය මත ද චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කල බවට නිගමනය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් නොවේ.

පැමිණිල්ල විසින් පැ.සැ. 5 වශයෙන් සාක්ෂියට කැඳවූ සාක්ෂිකරු ලබා දී ඇති සාක්ෂිය ඉහතින් සාකච්ඡා කර ඇති පරිදි චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කල බවට නිගමනය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් නොවේ.

පැමිණිල්ල විසින් පැ.සා.6 වශයෙන් සාක්ෂියට කැඳවා ඇත්තේ වෛද්‍ය තන්ත්‍රිගේ රවීන්ද්‍ර තිත්තරාජ් රුබේරුය. ඔහු විසින් දයාරත්න නැමැත්තාව වෛද්‍ය පරීක්ෂණය ලක් කල බවට පවසමින් වෛද්‍ය වාර්තාව පැ. 1 ලෙසට සලකුණු කර

ඉදිරිපත් කර වම් කනේ බෙරයෙහි ආශ්‍රිතව හොඳ වී ගිය තුවාලයක් නිරීක්ෂණය කල බවට පවසා සිටියද (2013.02.06 දින සාක්ෂි. පෙ.ව.10.15 ට. 1 සහ 2 පිටු. ) රෝගියාට එවැනි තත්ත්වයක් ඇති වුනේ කුමන කෙනෙක් පහර දීමකින්ද, කොහොම පහර දීමකින්ද කියන්න මහත්මයා දන්නේ නැහැ යනුවෙන් ප්‍රශ්න කිරීමේදි පවසා ඇත්තේ " නැහැ " යනුවෙනි.(2013.02.06 දින සාක්ෂි. 6 පිටුව.) මේ අනුව මෙකී සාක්ෂිකරු ලබා දී ඇති සාක්ෂියද චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කල බවට නිගමනය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් නොවේ.

17 JUN 2019

මේ හැරෙන්නට වෛද්‍ය මංගලා විසින් මෙම නඩුවට 2013.03.18 දින දාතමයෙන් හෝ යුතුව ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තාවෙහි අඩංගු කරුණු ද විත්තිය විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වන වගන්තිය යටතේ පිලිගැනීමක් කර තිබුනද එකී වෛද්‍ය වාර්තාව මගින් අනාවරණය වන්නේද දයාරත්න නමැත්තාගේ ඇසේ ආබාධිත තත්ත්වයක් තිබී ඇති බවට පමණි. එකී ආබාධිත තත්ත්වයට වගකියුත්තේ මෙම චූදිතයින් බවට නිගමනය කල හැකි යමක් එහි සඳහන් නොවේ. මේ අනුව එකී වෛද්‍ය වාර්තාවද චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කල බවට නිගමනය කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් නොවේ.

පැමිණිල්ල විසින් පැ.සා. 8 වශයෙන් සාක්ෂියට කැඳවා ඇති ලියන අබේවර්ධන මුණසිංහ නැමැත්තා ඉහත කී දයාරත්නගේ ප්‍රකාශය 2002.07.02 වන දින සටහන් කර ඇති නිලධාරියා වෙයි. ඔහු සිදු කර ඇති රාජකාරිය වන්නේ එකී පැමිණිල්ල සටහන් කර ඉහල නිලධාරියාට එය දැනුම් දීම පමණි.( 2013.06.09 වන දින සාක්ෂි. පෙ.ව. 10.40 ට ) පැමිණිල්ල විසින් පැ.සා. 9 වශයෙන් සාක්ෂියට කැඳවා ඇති කුලකුලසූරිය විතානගේ රෝෂාන් ප්‍රනාන්දු නැමැති පොලිස් නිලධාරියා මෙම නඩුවට අදාළ කාල සීමාවේදි හොරණ දිශාව භාර සහකාර පොලිස් අධිකාරීවරයාය. ඔහු විසින් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ මෙම චූදිතයින්ට එරෙහිව අඟුරුවාතොට පොලිසියට ඉදිරිපත් කරන ලද පැමිණිල්ල ඔහු වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව 2002.07.30 වන දින පැ.සා.1 ගේ පැමිණිල්ලක් සටහන් කර චූදිතයින් දෙදෙනාගේ ප්‍රකාශ සටහන් කිරීමට පියවර ගත් බවටයි. ( 2013.09.12 දින සාක්ෂි. 2 පිටුව සහ එදිනම පෙ.ව.11.10 ට. 1 සහ 2 පිටු.) මේ හැරෙන්නට සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී පැ.සා.1 ව බීමත්ව අශෝබන ලෙස හැසිරීමේ වරද සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන තිබූ බවට අනාවරණය වූ බවටද, අවසන් වාර්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඊ.ටී.එල්.ඒ. අමරසේකර විසින් නීතිපතිට යොමු කර තිබූ බවටද සාක්ෂියක් ලබා දී ඇති මුත් ( 2013.09.12 දින සාක්ෂි. 2 පිටුව සහ එදිනම පෙ.ව. 11.10 ට. 9 පිටුව. )

චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදුකල බවට යම් කරුණක් අනාවරණය වු බවට සාක්ෂියක් ලබා දී නැත. එසේම මෙම නඩුවෙහි 2 වන චූදිතගේ ප්‍රකාශය සටහන් කර ගෙන තිබූ විද්‍යාරත්න ගලහිටියාවගේ විජේතුංග නැමති පොලිස් නිලධාරිවරයාවද පැමිණිල්ල විසින් පැ.සා.10 වශයෙන් සාක්ෂියට කැඳවා ඇති මුත් එකී සාක්ෂිය මගින් හෝ චූදතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවේ සඳහන් වරද චූදිතයින් සිදු කල බවට යම් නිගමනයකට පැමිණීම සඳහා කිසිදු කරුණක් අනාවරණය වී නැත.

පළාත්බද ... මහාධිකරණය
17 ...

ඉහත කරුණු සලකා බැලීමේදි පැමිණිල්ල විසින් සාක්ෂියට කැඳවූ පැ. සා. 8, පැ.සා. 9 සහ පැ.සා. 10 යන සාක්ෂිකරුවන් ලබා දී ඇති සාක්ෂි මගින් අධි චෝදනාවෙහි සඳහන් වරද චූදිතයින් විසින් සිදු කර ඇති බවට නිගමනයකට පැමිනිය නොහැකි බැවින් එකී සාක්ෂිකරුවන්ද ප්‍රමාණවත් සාක්ෂිකරුවන් ලෙසට සලකා බැලිය නොහැක.

2003 (1) ශ්‍රී ලංකා නව නීති වාර්තාහි 340 පිටුවේ සඳහන් නීතිපති එදිරිව බරණගේ නැමැති නඩුවේ උගත් අභියාචනාධිකරණ විනිසුරු අමරතුංග මැතිතුමා විසින් සඳහන් කළුනු ලැබුවේ " In a trial by A judge without a jury the judge is the trier of facts and as such at the end of the prosecution case in order to

decide whether he should call upon the accused for his defence he is entitled to consider such matters as the credibility of the witnesses" the probability of the prosecution case, the weight of evidence and the reasonable inferences to be drawn from the proven facts. Having considered those matters, if the judge comes to the conclusion that he cannot place any reliance on the prosecution evidence, then the resulting position is that the judge has wholly discredited the evidence for the prosecution. In such a situation the judge shall enter a verdict of acquittal.

Even if the judge has not wholly discredited the prosecution Evidence the words that the judge is of opinion that such evidence fails to establish the commission of the offence charged against the accused or of any other offence of which he might be convict4ed on such indictment give him the power to enter a verdict of acquittal without calling for the defense " යනුවෙනි.

40 නවනීති වාර්තා 505 පිටුවෙහි සඳහන් රජ එදිරිව විදානලාගේ අබ්‍රහම් අප්පුහාමි නඩුවේදී සුවිස් අගවිනිසුරුතුමා දක්වන ලද්දේ " The general rule is

that an accused need not prove his innocence. It is sufficient for him to create a reasonable doubt as to the truth of the case for the prosecution " යනුවෙනි. මෙම නඩු තීන්දුව අනුව චූදිතයෙකුට තම නිර්දෝෂිභාවය ඔප්පු කිරිම අනවශ්‍ය බවටත් පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද නඩුවේ සත්‍යතාවය සම්බන්ධයෙන් සාධාරණ සැකයක් මතු වී තිබිම ප්‍රමාණවත් බවටත් පෙනී යයි. එසේම 1980 (2) ශ්‍රී ලංකා නීති වාර්තා 167 පිටුවෙහි සඳහන් ජේම්ස් සිල්වා එදිරිව නීතිපති නඩුවේදීද අභියාචනාධිකරණ විනිසුරු රුද්‍රිගු මැතිතුමා සඳහන් කර ඇත්තේ " It is a grave error of law for a trial judge to direct Himself that he must examine the tenability and truthfulness of the evidence of the defense in the light of the evidence led by the Prosecution' Our criminal law postulates a fundamental presumption of Legal innocence of every accused till the contrary is proved. This is rooted in the concept of legal inviolability of every individual in our society; now Enshrined in our Constitution. There is not even a surface presumption of Truth in the charge with which an accused is indicted. Therefore to Examine the evidence of the accused in the light of the prosecution Witnesses is to reverse the presumption of innocence " යනුවෙනි.

ඉහත කී නඩු තීන්දුව අනුව පෙනී යන්නේ අධිකරණයක් විසින් චූදිතයින්ට නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙසට දක්වමින් විත්ති වාචකය කැඳවිය යුත්තේ චූදිතයින්ට එරෙහිව පවතින චෝදනාවෙහි සඳහන් වරදවල් සිදු කර ඇති බවට පැමිණිල්ල විසින් ඔප්පු කර ඇති අවස්ථාවකදී බවත් එසේ නොවන්නේ නම් චූදිතයින්ට නිශ්ශබ්දව සිටීමේ අයිතියක් පවතින බවටත්ය. මෙම නඩුවෙහි චූදිතයින්ට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනා පත්‍රයෙහි සඳහන් වරද කිසියම් චූදිතයෙකු විසින් සිදු කර ඇති බවට පැමිණිල්ල විසින් කැඳවන ලද සාක්ෂි මඟින් නිගමනය කල නොහැකි බවට තීරණය කර ඊට හේතු ඉහතින් දක්වා ඇත. මේ අනුව චූදිතයන්ට එරෙහිව නඟා ඇති චෝදනාව සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට පැමිණිල්ල සමත් වී නැති බවට තීරණය කරමි. මේ අනුව තවදුරටත් මෙම නඩුව පවත්වාගෙන යාම ප්‍රතිඵල රහිත බවට තීරණය කර නොකැඳවාම එකී චෝදනාවෙන් චූදිතයින් නිදොස් කරමි.

අත්/කලේ.....

(එස්.කේ.වීරවර්ධන)

මහාධිකරණ විනිසුරු - පානදුර

2013.10.30

පානදුර මහාධිකරණ විනිසුරු එස්. කේ. වීරවර්ධන මැතිතුමිය ඉදිරිපිටදී ය.

වාර්තා කරන්නේ :- ල/ලේ නිලූකා ඉන්ද්‍රසූරිය විසිනි.

නඩු අංකය:- 1966/2005

දිනය :- 2013.10.30

පානදුර මහාධිකරණය
17 JUN 2019

1,2 චූදිතයින් සිටි.

චූදිතයින් වෙනුවෙන් නීතිඥ හර්ෂ මාතරආරච්චි මහතා සහ නීතිඥ මහින්ද යූ ගමගේ මහතා පෙනී සිටි.

පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ චමල්කා සමරසිංහ මහත්මිය පෙනී සිටි.

තීන්දුව හා හේතු විවෘත අධිකරණයේදී ප්‍රකාශ කරමි. එය නඩු පොතට ගොනු කරමි. චූදිතයින්ට එරෙහිව නගා ඇති චෝදනාවන් පැමිණිල්ල විසින් ඔප්පු කර නොමැති බවට තීරණය කර අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 200(1) උප වගන්තිය යටතේ විත්තිය නොකැඳවාම චූදිතයින් චෝදනාවෙන් නිදොස් කොට නිදහස් කරමි.

අද දින ප්‍රකාශිත නියෝගයේ සහතික පිටපත් විත්තියට ගාස්තු සහිතව ලබා දෙන්න. එසේම මෙම තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් නොවුනහොත් මුදල් ඇප රාජසන්තික වී නොමැති නම් මුදල් ඇප තබා ඇති සියළුම අයවලුන්ගේ මුදල් ඇප මුදා හරින්න.

පළාත්බද මහාධිකරණය
17 JUN 2019

අත්/කලේ..

( එස්. කේ. වීරවර්ධන )

මහාධිකරණ විනිසුරු - පානදුර.

2013.10.30

ඉහතින් දැක්වෙන්නේ පානදුර මහාධිකරණ නඩු අංක 1966/2005 දරණ නඩුවේ තීන්දුවේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

සැකසුවේ හා සැසඳුවේ : 1.

O/24-746345

2019/05/31

රෙජිස්ට්‍රාර්.

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්
මහාධිකරණය
පානදුර